# ගම්පෙරළියේ පෙරළිය

ගම්පෙරළිය ගැන පමණක් නොව බොහෝ නවකතා ගැන ද බොහෝ දේ සඳහන්කළ යුතු නමුත් මේ ඒ සඳහා අවස්ථාව නො වෙයි. මෙහි දී අපේ අවශ්‍යතාව වනුයේ බටහිර කවිය බටහිර නවකතාවෙන් වෙනස්වන ආකාරයත් සිංහල කවිය බටහිර කවියෙන් වෙනස්වන ආකාරයත් සාකච්ඡා කිරීම ය. අප ගම්පෙරළිය ගැන මෙහි දී කතාකරන්නේ ඒ අරමුණෙන් ය. මෙරට සිංහලෙන් බටහිර අච්චුවේ නවකතා ලියූ පළමු තැනැත්තා වූයේ මාර්ටින් වික්‍රමසිංහ මහතා ය. කෙටියෙන් කිවහොත් ඒ මහතා බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ නවකතා සිංහලෙන් ලිවී ය. එපමණක් නොව ඒ මහතාට බටහිර නවකතා අච්චුවෙන් ම සිංහලෙන් කවි ලිවීමට ද අවශ්‍ය විය.

ගම්පෙරළියේ සඳහන්වන්නේ කයිසාරුවත්තේ මුහන්දිරම් ගැන වුවත් එහි ආර්ථික වශයෙන් අභේණියට යන්නේ කයිසාරුවත්තේ මුදලාලි ය. මුහන්දිරම් ආදී තනතුරුවල ගාම්භීරත්වය අභාවයට ගියේ බ්‍රිතානීන් මෙරටට යම් ආකාරයක දේශපාලන නිදහසක් දීමෙන් ද පසුව ය. එහෙත් පොතෙහි කියන්නට තැත්කරන්නේ ඊනියා වැඩවසම් සමාජයක් අභෝසිවීම ගැන ය. ලංකාවේ කිසිම දවසක යුරෝපයේ මෙන් වැඩවසම් සමාජයක් තිබී නැත. වැඩවසම් සමාජයක ඉඩම්වල අයිතිය රජුට රදළයන්ට හා පූජකවරුන්ට තිබිය යුතු ය. සිංහල සමාජයෙහි තිබුණේ ඉඩම්වල අයිතියක් නොව භාරකාරත්වයක් ය.

අයිතිය යන සංකල්පය අපට ලැබුණේ බටහිරයන්ගෙනි. විශේෂයෙන් ම ලන්දේසීන්ගෙනි. ඉඩම් අයිතියක් හඳුන්වා දී ඔප්පු තිරප්පු අපට හිමිකර දීමට ලන්දේසීහු කටයුතු කළහ. ඉංගිරිසිහු මේ අයිතිය තහවුරු කළහ. උඩරට සිංහල ගැමියන්ට මුඩුබිම් පණත යටතේ ඉඩම් අහිමි කිරීමට ඉංගිරිසින්ට හැකිවූයේ අයිතිය යන සංකල්පය නොතිබූ රටක ගැමියන්ට ඊනියා අයිතියක් පෙන්වීමට නොහැකි වූ බැවිනි. අපේ නොතිබූ වැඩවසම් සමාජයක් ගැන පඬිවදන් ලියන්නෝ බටහිරයන්ගෙන් ඉගෙනගත් ඔවුන්ට අනුව ලෝකය බලන මෙරට හා පිටරට සමාජ විද්‍යාඥයෝ ය.

කෙසේ වෙතත් මෙරට නොතිබූ වැඩවසම් සමාජයක අභාවය ගැන කියන්නට හම්පෙරළිය ලියූ නමුත් මුහන්දිරම් වැනි චරිත ඔස්සේ ඒ නොකළ හැකි බව මාර්ටින් වික්‍රමසිංහ මහතා කල්පනා නොකරන්නට ඇත. මුහන්දිරම් වැනි නිලතල සිංහල සමාජයේ නිලතල නොව බ්‍රිතානීන්ගේ ම නිලතල බව ඒ මහතාට අමතක වන්නට ඇත. කෙසේ වෙතත් ගම්පෙරළියෙහි අභාවයට යන්නේ එවැනි නිලතල නොවන්නේ බ්‍රිතානි යටත්විජිතවාදය යටතේ ඒ අභාවයට නොගිය බැවිනි.

ගම්පෙරළියෙහි අභාවයට යන්නේ කයිසාරුවත්තේ මුහන්දිරම් නමැති සුළු මුදලාලි කෙනෙකි. ඇතැම් සුළු මුදලාලිලා අභාවයට ගියේ ධනපති ක්‍රමය යටතේ සුළු මුදලාලිලා නැති වී ලොකු මුදලාලිලා ඇතිවීමෙන් නොව ඔවුන්ට වෙළෙඳාම නුහුරු වූ බැවිනි. මාතර හාමිනේ වැන්නන්ට කෙසේවත් වෙළෙඳාම හුරු නැත. ඒ පෞද්ගලික කරුණකි. බොහෝ සිංහලයන්ට අදත් වෙළෙඳාම හුරු නැත්තේ සිංහල සමාජය වෙළෙඳාම මත නොව කෘෂිකර්මය හා ස්වයංපෝෂණය මත පදනම් වූ සමාජයක් බැවිනි. අද ද සමාජයේ වෙළෙඳාම වැඩියෙන් කෙරෙන්නේ දෙමළ මුස්ලිම් ජනවර්ග හා දකුණු පළාතේ සිංහලයන් කිහිප දෙනකු අතිනි. කයිසාරුවත්තේ මුහන්දිරම් හෙවත් මුදලාලි හා මාතර හාමිනේ දකුණේ වුවත් ඔවුන්ට ද වෙළෙඳාම හුරු වී නැත.

මෙයින් මා පෙන්වීමට තැත්කරන්නේ ගම්පෙරළියෙන් පොදු සමාජ විපර්යාසයක් පිළිබිඹු නොවන බව ය. වික්‍රමසිංහ මහතාට කීමට අවශ්‍ය වූයේ කුමක් වුවත් පොතෙන් කියැවෙන්නේ පවුලක කතාවකි. මෙහි ඊනියා වැඩවසම් සමාජයක් අභාවයට ගොස් ධනපති සමාජයක උපතක් නො දැක්වෙයි. වික්‍රමසිංහ මහතා බටහිර මාක්ස්වාදී අදහස් කටගාගෙන වැඩවසම් ක්‍රමය නැතිකර ධනපති ක්‍රමය ඇතිවන බව දැනසිටියත් ලංකාවේ වැඩවසම් ක්‍රමයක් නැතිවිට ඒ අභාවයට යා නොහැකි බව නොදැන සිටි බව පැහැදිලි ය. කයිසාරුවත්තේ මුහන්දිරම් නම් මුදලාලි අභාවයට යන්නේ ධනපති ක්‍රමයේ සුළු මුදලාලි නැති වී ලොකු මුදලාලි ඇතිවන ඊනියා ඒකාධිකාර ගොඩනැගීමක් නිසා නොව ක්‍රයිසාරුවත්තේට හා මාතර හාමිනේට වෙළෙඳාම නුහුරු බැවිනි. ඔවුහු ගැමියන්ට අනුකම්පා කරති. ඔවුන් ගැමියන්ට ණයට දෙන්නේ ඒ ණය ආපසු නොගෙවන බව දැනගනිමිනි.

© Prof. Nalin De Silva

මාර්ටින් වික්‍රමසිංහ මහතාට පැහැදිලිව ම වැඩවසම් ක්‍රමය ගිලාබැස යමින් ධනපති ක්‍රමය උපදින ගම් පෙරළියක් තම පොතෙන් නිරූපණය කිරීමට අවශ්‍ය වූ බව පැහැදිලි ය. එහෙත් ගම්පෙරළිය පොතෙන් එවැන්නක් නො සිදුවෙයි. එබැවින් වික්‍රමසිංහ මහතා අගයන බටහිර නවකතා අච්චුවට අනුව වුව ද ඒ අසාර්ථක කෘතියකි. එහෙත් ගම්පෙරළිය උසස්ම සිංහල නවකතාව ලෙස පැසසුම් ලබයි. ඒ ඇසුරෙන් නිපදවන ලද චිත්‍රපටියට ද සම්මාන ලැබී ඇත. ඒ එසේ සිදුවූයේ කෙසේ ද යන්නට ද කෙටි පිළිතුරක් දිය යුතු ය.

එයට ප්‍රධාන හේතු දෙකක් වෙයි. එක් හේතුවක් වූයේ පේරාදෙණි විශ්වවිද්‍යාලයේ එදිරිවීර සරච්චන්ද්‍ර මහතාගෙන් ගම්පෙරළියට ලැබුණු අනුග්‍රහය ය. සරච්චන්ද්‍ර මහතා මෙරටට කේම්බ්‍රිජ් සාහිත්‍ය විචාරය හඳුන්වාදුන් පේරාදෙණි විශ්වවිද්‍යාලයෙහි ඉංගිරිසි මහාචාර්ය ලුඩොවයික් මහතා අනුව ගොස් බටහිර සාහිත්‍ය විචාරය සිංහල නවකතාවට යොදාගත්තේ ය.  ඒ මහතා පසුව ප්‍රචලිත වූ යථාර්ථවාදී සාහිත්‍ය විචාරය අනුගමනය නොකළත් ඊනියා තාත්විකවාදී සාහිත්‍ය විචාරයක් අනුගනමනය කෙළේ ය. අද්භූතවාදී සාහිත්‍යයක් වෙනුවට විශ්වාස කළහැකි තාත්විකවාදී සාහිත්‍යයක් ඒ මහතා අගය කෙළේ ය. ඒ මහතාට ගම්පෙරළිය තාත්විකවාදී උසස් කෘතියක් විය.

සරච්චන්ද්‍ර මහතාට දේශපාලන බලයක් විය. ඒ පාර්ලිමේන්තුවේ හෝ දේශපාලන පක්ෂයක තිබූ බලයක් නො වේ. අද ඇතැමුන් ඊනියා සිවිල් බලය යනුවෙන් හඳුන්වන්නේ සමාජයේ ඒ ඒ ක්ෂෙත්‍රවල ඒ ඒ පුද්ගලයන් දරණ දේශපාලන බලය යි. යම්කිසි ආකාරයක බලයක් ක්‍රියාකරන ක්ෂෙත්‍රයක බලාධිපත්‍යය හේතුකොටගෙන දේශපාලන බලයක් ඇතිවෙයි. සාහිත්‍යයේ ද බල අරගලයක් වෙයි. ඒ බල අරගලය තාවකාලික ව කෙළවර වන්නේ බලය වැඩි කිනම් කණ්ඩායමට ද යන්න මත ය. ඩබ්ලිව්. ඒ. සිල්වා මහතා හා පියදාස සිරිසේන මහතා සිංහලෙන් කතාකීමේ කලාවේ මාර්ග දෙකක ගමන් කරමින් සිටියහ. මාර්ටින් වික්‍රමසිංහ මහතා බටහිර ඊනියා යථාර්ථවාදී රීතිය අනුගමනය කෙළේ ය. (ඒ සාර්ථක වී ද නැත් ද යන්න වෙන ම ප්‍රශ්නයකි.)  සරච්චන්ද්‍ර මහතා වික්‍රමසිංහ මහතා අනුගමනය කිරීමට තැත්කළ රීතිය අගය කෙළේ ය.

සරච්චන්ද්‍ර මහතාට සාහිත්‍යයෙහි අවශ්‍ය දේශපාලන බලය ලැබුණේ ලංකා විශ්වවිද්‍යාලය ඔස්සේ ය. ඉංගිරිසීන් විසින් බටහිර ක්‍රිස්තියානි නූතනත්වය මෙරට ප්‍රචලිත කිරීම සඳහා පිහිටුවන ලද ලංකා විශ්වවිද්‍යාලයට ඒ ඉංගිරිසින් නිසාම ආධිපත්‍යයක් ලැබී තිබුණේ ය. සරච්චන්ද්‍ර මහතාට පමණක් නොව බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට පටහැණිව නොයන ඕනෑම විශ්වවිද්‍යාලයීය ආචාර්යවරයකුට මේ දේශපාලන බලය ලැබෙයි. විශේෂයෙන් ම ඔහු අතින් ජාතිකත්වයට පහරක් එල්ල කෙරේ නම් ඔහුට තව තවත් බලය ආරෝපණය වෙයි. ජාතිකත්වය අගය කළ පියදාස සිරිසේන මගතාගේ කතා විවේචනය කිරීමෙන් සරච්චන්ද්‍ර මහතාට ඒ අතිරේක බලය ද හිමිවිය. සරච්චන්ද්‍ර මහතා සාමාන්‍ය පාසල් ගුරුවරයකු වී නම් ඒ මහතාට එතරම් දේශපාලන බලයක් අත් නොවන බව පැහැදිලි ය.

අනෙක් අතට ඒ මහතා විසින් බිහිකරන ලද ශිෂ්‍ය පරම්පරාවක් විය. මේ ශිෂ්‍ය පරම්පරාව එක්කෝ පරිපාලනයෙහි ඉහළ තනතුරු දැරූහ. නැතහොත් පාසල් ගුරුවරු ලෙස සේවය කළහ. ඒ කුමක් වුවත් ඔවුන්ට ද යම් බලයක් හිමිවිය. එකල උපාධිධාරියකු වීම නිසාමත් යම් දේශපාලන බලයක් හිමිවිය. විශ්වවිද්‍යාල ප්‍රවේශ පරීක්ෂණයට පොත් නියම කළෝ විශ්වවිද්‍යාලයීය ආචාර්යවරු ය. මෙසේ නියම කෙරුණේ තමන්ට රුචි පොත් බව අමුතුවෙන් කිවයුතු නො වෙයි. අධ්‍යාපන දෙපාර්තමේන්තුව විභාග දෙපාර්තමේන්තුව ඔස්සේ ද සරච්චන්ද්‍ර මහතාගේ ගෝලයෝ තම ආධිපත්‍යය පැතිරවූහ.

පේරාදණි සාහිත්‍යය යනු සරච්චන්ද්‍ර, අමරසේකර මහතුන් විසින් නිර්මාණය කෙරුණු සාහිත්‍යය නො වේ. අද බොහෝ දෙනා වැරදියට වටහාගෙන සිටිය ද, පේරාදෙණිය සාහිත්‍යය යනු පේරාදෙණි ගුරුකුලය විසින් අගය කෙරුණු සාහිත්‍ය ය. පේරාදෙණි ගුරුකුලය යනු පේරාදෙණිය විශ්වවිද්‍යාලය විසින් ප්‍රචලිත කෙරුණු සාහිත්‍ය විචාරය පිළිගත් පිරිස ය. එහි වැඩිවශයෙන් වූයේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයන අංශයේ ඉගෙන ගත් සිසු සිසුවියන් ය. පේරාදෙණි ගුරුකුලය එසේ හඳුනාගත් පසු පේරාදෙණි සාහිත්‍යය හඳුනාගැනීම අපගසු නො වේ. පසු කලෙක මාර්ටින් වික්‍රමසිංහ මහතා ද ගුණදාස අමරසේකර මහතා ද ඒ සාහිත්‍යයට කුමක් කිව ද කලෙක ඔවුන්ගේ නිර්මාණ ද අයත්වූයේ පේරාදෙණි සාහිත්‍යයට ය.

© Prof. Nalin De Silva

සරච්චන්ද්‍ර මහතා මාර්ටින් වික්‍රමසිංහ මහතා ඔසවා තැබී ය. සරච්චන්ද්‍ර මහතාගේ සාහිත්‍ය විචාරයට වික්‍රමසිංහ මහතාගේ කෘති ගැලපුණේ ය. ගම්පෙරළිය සරච්චන්ද්‍ර මහතාට තාත්වික නවකතාවක් විය. කෙසේ වෙතත් ඒ දෙදෙනාම අවසාන වශයෙන් කෙළේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට සේවයකිරීම ය. කෙතරම් සංස්කෘතිය ගැන කතාකළ ද ඔවුන්ගේ සාහිත්‍යය ජාතික සංස්කෘතියක් මත පදනම් නො වී ය. මනමේ, සිංහබාහු නාට්‍ය දෙක පමණක් පේරාදෙණි සාහිත්‍යයෙන් බිහිවූ ජාතික නාට්‍ය දෙකක් වශයෙන් පවතියි. එයට හේතුව ඒ නාට්‍ය නිර්මාණයෙහි දී සරච්චන්ද්‍ර මහතාට සිංහල ගැමි නාටකය සොයා යෑමට සිදුවීම ය.

පසුව සුචරිත ගම්ලත් මහතා විසින් සරච්චන්ද්‍ර මහතා අතික්‍රමණය කෙරිණි යැයි කියනු ලැබේ. ගම්ලත් මහතා විසින් කරණ ලද ඊනියා අතික්‍රමණයක් හෝ සමතික්‍රමණයක් හෝ නැත. ඒ මහතා කෙළේ ට්‍රොට්ස්කිවාදී සාහිත්‍ය විචාරය භාවිතාකිරීම පමණ ය. සරච්චන්ද්‍ර සාහිත්‍ය විචාරය මෙන් ම එය ද තවත් හුදු අනුකරණයක් පමණක් විය. ගම්පෙරළිය ට්‍රොට්ස්කිවාදී සාහිත්‍ය විචාරයට මෙන් ම ස්ටැලින්වාදී සෝවියට් සමාජ යථාර්ථවාදී සාහිත්‍ය විචාරයටත් ප්‍රියමනාප කෘතියක් වූයේ අර කොහේවත් නැති වැඩවසම් ගමක් මාක්ස්වාදී අච්චුවට අනුව වෙනස්වීමක් ඉන් නිරූපණය කිරීමට තැත්කර තිබූ නිසා ය. තාත්විකත්වය යථාර්ථවාදය බැරිනම් යථය ගැන මොන කතා කීවත් මේ සෑම සාහිත්‍ය විචාරයකින් ම කෙරෙන්නේ තමන් සමාජය දකින ආකාරය කෘතියෙන් නිරූපණය වන්නේ දැයි විමසා බැලීම ය. එසේ නිරූපණය වන බවක් පෙනී යන්නේ නම් ඒ කෘතිය සාර්ථක කෘතියක් යැයි කියනු ලැබෙයි. ඒ සෑම විචාරයක් ම අවසානයේ දී ජාතිකත්වයේ හරහට සිටියි. ගම්පෙරළියෙන් වූ එකම පෙරළිය ජාතිකත්වය පෙරළීම ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva